# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2000 අංක 10 දරන කත්තන්තොට අල්-කුල්ලියතුන් නූරියියා (අරාබි විද්‍යාලයේ) මජුරා සභාව (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2000 මැයි මස 04 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 මැයි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**2000 අංක 10 දරන කත්තන්කුඩි අල්-කුල්ලියතුත් තුරියියා (අරාබි විද්‍යාලයේ ) මජ්ලිස් සභාව (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2000 මැයි මස 04 වන දින]

එල්.ඩී.-ඕ. 42/98.

**කත්තන්කුඩි අල්-කුල්ලියතුත් තුරියියා (අරාබි විද්‍යාලයේ) මජ්ලිස් සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

කත්තන්කුඩි අල්-කුල්ලියතුත් තුරියියා (අරාබි විද්‍යාලයේ) මජ්ලිස් සභාව යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක් එහි සාමාජිකයන් විසින් එකඟ වී ඇති රීතිවලට අනුකූලව එහි පරමාර්ථ සඵලාත්මකව මුදුන් පමුණුවා ගැනීම සහ එකී අල් කුල්ලියතුත් තුරියියා (අරාබි විද්‍යාලයේ) මජ්ලිස් සභාවට සම්බන්ධ සියලු කරුණු ඉටු කර ගෙන යාම සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ කත්තන්කුඩි පිහිටුවා ගෙන තිබුණු හෙයින් ද : පූර්විකාව.

එකී ආයතනය පිහිටුවීමට මුල් වූ පරමාර්ථ සහ කාරණා එකී ආයතනය විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී කත්තන්කුඩි අල් කුල්ලියතුත් තුරියියා (අරාබි විද්‍යාලයේ) මජ්ලිස් සභාව සංස්ථාගත කරන ලෙස එකී විද්‍යාලයේ මජ්ලිස් සභාව විසින් ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 2000 අංක 10 දරන කත්තන්කුඩි අල්-කුල්ලියතුත් තුරියියා (අරාබි විද්‍යාලයේ) මජ්ලිස් සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "විද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කත්තන්කුඩි අල්-කුල්ලියතුත් තුරියියා (අරාබි විද්‍යාලයේ) මජ්ලිස් සභාවේ සාමාජිකයන් සහ මේ යටතේ සාදන ලද රීතිවලට අනුකූලව තෝරා පත් කරන ලද හෝ පත් කරන ලද ඔවුන්ගේ අනුප්‍රාප්තිකයන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) කත්තන්කුඩි අල්-කුල්ලියතුත් තුරියියා (අරාබි විද්‍යාලයේ) මජ්ලිස් සභාව යන නාමය හා අභිධානය යටතේ සංස්ථාවක් විය යුතු අතර මෙයින් එසේ සංස්ථාපනය කරනු ලැබේ. තවද ඒ නාමයෙන් සංස්ථාව විසින් සහ ඊට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට තිබිය යුතු ය. අල් කුල්ලියතුත් තුරියියා (අරාබි විද්‍යාලයේ) මජ්ලිස් සභාව සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :-

(අ) කත්තන්කුඩි පිහිටුවා ඇති අල්-කුල්ලියතුත් (අරාබි විද්‍යාලය) කළමනාකරණය කිරීම, සංවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම ;

(ආ) "ශුද්ධ වූ කුරානයට" සහ "හදිත්" වලට අනුකූලව අරාබි භාෂාවෙන් ඉස්ලාම් ඉගැන්වීම සඳහා ධෛර්යය දීම, සංවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම ;

(ඇ) "උලමාවරු" නමින් හඳුන්වනු ලබන ඉස්ලාමීය ආගමික උගතුන් පුහුණු කිරීම සඳහා පහසුකම් සැපයීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අනුමත කර ඇති විෂයමාලාවන්ට අනුකූලව ඉස්ලාම් ඉගෙන ගැනීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දීම හා ඔවුන් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ පරීක්ෂණ සඳහා සූදානම් කරවීම ;

(ඉ) "තජිවිද්" වලට අනුකූලව නොහොත් නියි උච්චාරණය සහිතව ශුද්ධ වූ කුරානය කට පාඩමින් කියවීම ධෛර්යමත් කිරීම ;

(ඊ) මුස්ලිම් ස්ත්‍රීන්ගේ සමාජයීය, ආර්ථික හා අධ්‍යාපනික දියුණුව උදෙසා වෙනම අංශයක් පිහිටුවා පවත්වා ගෙන යාම ;

(උ) සුදුසු සිසු දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම හා ඔවුන්ට වැඩිදුර ඉගෙනීමට හැකිවීම සඳහා අවශ්‍ය යයි සැලකෙන වෙනත් උදව් උපකාර කිරීම ;

(ඌ) ප්‍රදේශයේ ලැබෙන අමුද්‍රව්‍ය උපයෝගී කරගෙන යම් කර්මාන්තයක් හෝ වෙළෙඳාමක් කිරීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් පුහුණු කිරීම හා ඒ සඳහා ඔවුන් ධෛර්යමත් කිරීම ;

(එ) ඉහත සඳහන් පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා හිතකර හෝ ආනුෂාංගික වන හෝ විය හැකි වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ හා වසා දැමීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද දේශීය හෝ විදේශීය ප්‍රභව වලින් ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ හා එකතු කිරීමේ ද සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාව වෙත සතුකර දී ඇති හෝ සංස්ථාව විසින් අත්කර ගෙන ඇති හෝ සංස්ථාව විසින් දරනු ලබන යම් ඉඩමක ගොඩනැගිලි කිසිවක් ඉදිකිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයෙහි යෙදවීමේ, සේවයෙහි නියුක්ත කිරීමේ හා සේවයෙන් ඉවත් කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීමට හෝ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය හෝ හිතකර හෝ උචිත කවර වූ හෝ සියලු කටයුතු, කාරණා හා දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට තිබිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

5. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එවැනි රීති සාදනු ලැබීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ රීති.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විද්‍යාලයෙහි බලපැවැත් වූ රීති මේ පනතේ විධිවිධානවලට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවනතාක් දුරට මේ වගන්තිය යටතේ සංස්ථාව විසින් සාදනු ලැබූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තා හ.

6. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විද්‍යාලයේ පැවති සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට විද්‍යාලයට අය විය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් හා ආධාර මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

විද්‍යාලය විසින් ගෙවිය යුතු සහ විද්‍යාලයට අය විය යුතු ණය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

7. යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව වෙත සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාවට නීතියෙන් බලය හා හැකියාව තිබිය යුතු ය. තවද එවැනි සියලු දේපළ මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව ද ඒ දේපළ උකස් කිරීමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව ද සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

8 (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් ලැබුනා වූ හෝ මින් මතු ලැබෙන ත්‍යාග, අන්තිම කැමති පත්‍රයකින් පැවරීම්, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන සංස්ථාව විසින් තීරණය කරණු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ මුදල් සහ දේපළ කවර ආකාරයකින් ලැබුණ ද මෙහි දක්වා ඇති පරිදි හුදෙක් ම සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා පමණක් ම යෙදවිය යුතු ය.

ගිණුම් හා විගණනය.

9. (1) සංස්ථාවට ලැබුණු හෝ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව සංස්ථාව විසින් නිසි අයුරින් ගිණුම් තැබීමට සැලැස්විය යුතු ය.

(2) සංස්ථාව විසින් පත් කරන ලද වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකයන් විය යුතු විගණකවරයකු හෝ විගණකවරයන් විසින්, සෑම වර්ෂයක දී ම යටත් පිරිසෙයින් එක් වරක්වත් සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට විගණනය කළ යුතු අතර ආදායම් සහ වියදම් ගිණුමෙහි සහ ශේෂ පත්‍රයෙහි නිරවද්‍යතාව තහවුරු කළ යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

10. සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

11. මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

12. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.